## ශාන්තිකර්ම ගී (පහතරට)

සිහින් සිනිඳු සළු ඇඳගෙන චිත් අන් මර ගන
වහන්ස නුඹ අප අතහැර කිමද මහණ උන
අහංකාර වී මරගන දැක්කා බුදුගුණ
මිහින්තලා ධාතු බෙලෙන් කඩතිර අරි මින

දෙසවන ලා රන්තෝඩු උදාරා
ලෙස කරලා මල් මාල අදාරා
උවන නිලා නිල් ගිරි අව තාරා
දෙව් විපුලා සිරි මෙ කළු කුමාරා

රක සුවන් උවන් මින කිරුළක් දැරුවේ
රුවන් රකුසා සොලසක් පිරි වැරුවේ
සොඳුරු කතුන් ළැම මුදුනින් දැරුවේ
කුමරුවන් විසින් කළ හැම ලෙඩ දුරුවේ

ළංකොට ගං කොට දී වැඩ වන්නේ
තුන් සැන්දෑවේ කොළ ඇවි දින්නේ
රන්කම් විදියේ කවුද අ සින්නේ
රතිකම් යකු මේ පුද අරගන්නේ

## කමත් ගී

සමනල මහ වෙහෙර උස ට ගෙනෙන් පුරව මේ කමත ට
කැලණිය මහ වෙහෙර උස ට ගෙනෙන් පුරව මේ කමත ට
මක්කම මහ වෙහෙර උස ට ගෙනෙන් පුරව මේ කමත ට
රන්වැලි මහ වෙහෙර උස ට ගෙනැත් පුරව මේ කමත ට

## දැල් ගී

හෙලේ වලෙයි ලෝ වෙලමා ලේ ලකඩි ලෙලෝ
හෙලේ වලෙයි ලෝ වෙලමා ලේ ලකඩි ලෙලෝ

## නෙලුම් ගී

තෙල් ගාලා හිස පිරන් නැනෝ
සේලේ අරගෙන ඇඳගන් නැනෝ
ඇට වැල ඇරගෙන බැඳගන් නැනෝ
ගොයම් නෙළන්නට යමු අපි නැනෝ

උදේ සිටන් වකුටු කොන්ද දිග ඇරපල්ලා
අතේ තිබෙන ගොයම් මිටිය බිම දමපල්ලා
හිසේ තිබෙන ලේන්සු පොඩි අතට ගනිල්ලා
සතරවරම් දෙවි පිහිටෙන් ගොඩට යමල්ලා

ඉපල් පිටින් ගහන අව්ව පිටට ඉහිරවන්නේ
තෙතඟු තෙතරි යේ දිගුතර ඒක එහෙම වන්නේ
රන් කැකිරක් කාපු ලෙසට කටට මිහිර වන්නේ
තා දිගුතරි යේරිගුතරි ඒක එහෙම වන්නේ

නිල් හබරල ගොයම් ලෙසට ගොයම් නිල්ල වන්නේ
තෙතඟු තෙතරි යේ දිගුතර ඒක එහෙම වන්නේ
මේ කුඹුරේ නෙලූ කලට ගොයම් රෝග වන්නේ
තා දිගුතරි යේරිගුතරි ඒක එහෙම වන්නේ

## ඔළිඳ කෙලි ගී

ඔළිඳ තිබෙන්නේ කොයි කොයි දේසේ
ඔළිඳ තිබෙන්නේ බංගලි දේසේ
ගෙනත් සදන්නේ කොයි කොයි දේසේ
ගෙනත් සදන්නේ සිංහල දේසේ

ගොයම් කපාලා ඇඹුල් තනාලා නාන්ඩ යන හැටි බලන් කලූ
සේලේ ඇඳලා නෙරිය තියාලා මිදුලේ සක්මන් කරයි කළු
දහසක් දීලා වළලු තනාලා දෑතේ පළඳා බලයි කළු
දුනුකේ මල සේ උලුගෙය් ඇඳ පිට ඔළිඳ කෙළින සැටි බලන් කලූ

ඔළිඳ කපුරු අද බල කොයි නැනෝ
එක් පෙති වෙච්චද බල කොයි නැනෝ
දෙපෙති වෙච්චද බල කොයි නැනෝ
තුන්පෙති වෙච්චද බල කොයි නැනෝ

රැන් ඇදිච්ච ද බලකොයි නැනෝ
ගසට පලච්චද බල කොයි නැනෝ
මල් හට ගත්තද බලකොයි නැනෝ
පලු හට ගත්තද බලකොයි නැනෝ

කිරිසල් වෙච්චද බල කොයි නැනෝ
ඔළිඳ පැසිච්චද බලකොයි නැනෝ
ඔළිඳ කඩන්නට යමු අපි නැනෝ
ඔළිඳ කඩන්නෙ මොකෙන්ද නැනෝ

ඔළිඳ කඩන්නට මොකක් ගෙනෙන්නේ
රත්තරනින් රන් කෙක්ක ගෙනෙන්නේ
කෙක්ක කපන්නට මොකක් ගෙනෙන්නේ
රත්තරනින් රන් ගිරේ ගෙනෙන්නේ

කෙක්ක වෙලන්නට මොකක් ගෙනෙන්නේ
රත්තරනින් රන් කෙන්ද ගෙනෙන්නේ
ඔළිඳ නෙළන්නට මොකක් ගෙනෙන්නේ
රත්තරනින් රන් පෙට්ටි ගෙනෙන්නේ

## ලී කෙලි ගී

ඉරට ඔබිය ඉර මුදුනේ සිටියා
සඳට ඔබිය සඳ මුදුනේ සිටියා
ලියට ඔබිය සුදු සේලෙන් නෙරියා
අපට ඔබිය සබ මැද ලී කෙළියා

බො අත්තට වැද සිරස නමන්නේ
ආපස්සට වැඳ මුණ පෙරලන්නේ
ඒ වැන්නේ වැද අප හඳුනන්නේ බො පත්තිනි මට අවසර දෙන්නේ

එක පඳුරෙන් ලී සයක් කපා ගෙන
එක උස ඇති සදෙනෙක් තෝරා ගෙන
ගුරුන් අතට දී ලී බෙදාගෙන
අපිත් කෙළිමු ලී දෙ පිල සැදී ගෙන

ජන ගී ආශ්‍රිත තවත් ලිපියක් ලබන කලාපයෙන්

**උපාලි පෙරේරා**
**වාද්‍ය විශාරද**